## පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව
-----------------------------
## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 08 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 පෙබරවාරි මස 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.
-------------------------------------------------------------------

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීඒ/ශ්‍රීලරාඅගිප්‍ර දරන පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------------

මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමට ඇතුලත් පර්ශ්‍ර 06 කට අදාල ගොඩනැගිලිවල වටිනාකම රු. 49,846,200 වූ අතර ඒවායේ ඉඩම්වල වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 **ලැබිය යුතු ගිණුම්**

වර්ෂ 02 සිට වර්ෂ 18 ක් දක්වා වූ කාල පරිච්ඡේදයකට අයත් එකතුව රු. 226,309 ක් වූ ලැබිය යුතු කඩ කාමර කුලී අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමතිකම නිසා එම විෂයයන් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට හෝ පරික්ෂා කිරිමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම (රු) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
| --- | --- | --- |
| ඉඩම් හා ගෙඩනැගිලි | 49,846,200 | විස්තරාත්මක උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකම් ඔප්පු |
| විවිධ තැන්පතු | 600,863 | ලැබීම් කුවිතාන්සි, කාලවිශ්ලේෂණ, විස්තරාත්මක උපලේඛන |

1.3.5 **නීති,රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම**

පලාත් පාලන, පලාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයට අනුකූලව මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 09 සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,358,125 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 383,973 ක් විය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව සේවා සඳහා ගාස්තු අය කිරීම රු. 3,433,417 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,974,152 කින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| බදු කුලී | 568 | 450 | 212 |
| බලපත්‍ර ගාස්තු | 282 | 214 | 123 |
| වෙනත් ආදායම් | 2,606 | 2,327 | 491 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් දුර්වලතා

නැගෙනහිර පලාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතියෙන් ලද UPVC බට සහ එහි සවි කිරීම් (UPVC Pipes & Fittings ) අවිධිමත් පාලනය

ඉහත සඳහන් ව්‍යාපෘතිය මගින් ප්‍රජා සහභාගීත්වයෙන් බට එලීම සඳහා ප්‍රාදේශීය සභාවට 2012 සහ 2013 වර්ෂයන් වලදී UPVC බට සවිකිරීම් කොන්ත්‍රාත් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

i. සභාවට ලැබුණු බට සහ සභාවෙන් නිකුත් කරන ලද බට පිළිබඳ තොරතුරු ඇතුලත් තොග ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

ii. අදාල බට එලීමේ කාර්යයන් ප්‍රජා සහභාගීත්වයෙන් කල යුතුව තිබුණද ප්‍රජා සමිති මූල්‍ය දුෂ්කරතා මත ඉදිරිපත් නොවීම හේතුවෙන් සභාව විසින් එම වැඩ ඉටුකර තිබුණි. නමුත් අතුරන ලද බට පිළිබඳ විස්තර සභාව විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

iii. ඉතිරි වී තිබූ විශාල බට තොගයක් පදවි ශ්‍රී පුර, ජයන්ති පුර සහ සමන්පුර යන ගබඩාවල අවිධිමත් ලෙස ගබඩා කර තිබීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ඉතිරි බට තොගයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම.**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

i. 2014 ජුනි 30 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අළුත්වැඩියා කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 10 ක් අළුත්වැඩියා කිරීමටත් , ඉවත්කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 15 ක් ඉවත් කිරීමටත් 2014 නොවැම්බර් 25 දක්වා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

ii. භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව සමීක්ෂණය සඳහා ඉදිරිපත් නොකල පොත් 48 ක්, අස්ථානගත භාණ්ඩ වර්ග 25 ක් සහ ඉන්වෙන්ට්‍රි ගත නොකල භාණ්ඩ අයිතම 108 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග විගණිත දිනය වූ 2014 නොවැම්බර් 25 දින දක්වා ගෙන නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

### (අ) පැරණි මැදවච්චිය මාතෘ හා ළමා සායන මධ්‍යස්ථානය ඉදි කිරීම.

ප්‍රාදේශීය සභාව පැරණි මැද වච්චිය ග්‍රාම සේවා වසමේ මාතෘ හා ළමා සායන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ රු. 4,074,017 ක (වැට් රහිත) කොන්ත්‍රාත් වටිනාකමකට 2013 සැප්තැම්බර් 24 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

i. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ඉදිකිරීම් කටයුතු 2013 දෙසැම්බර් 23 දින වන විට අවසන් කල යුතුව තිබුණු නමුත් අදාල ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර ගොඩනැගිල්ල 2014 ජූලි 01 දින සභාවට භාර දී තිබුණ ද, ගොඩනැගිල්ලේ පිටත තාප්පය සම්පූර්ණ කිරීම , නාම පුවරුව සවි කිරීම , විදුලි සැපයුම ලබා ගැනීම, පිටත භූමිය පස් තලා මට්ටම් කිරීමේ කටයුතු විගණන ක්ෂේත්‍ර පරීක්ෂණ දිනය වූ 2014 නොවැම්බර් මස 25 දින වන විට ද සම්පූර්ණ කර නොතිබුණි.

ii. සායන මධ්‍යස්ථානය ඉදිකිරීමේ අරමුණ වූ පරණ මැද වව්විය ග්‍රාම සේවා වසමේ පවුල් 250 කගේ කාන්තා හා ළමා සෞඛ්‍යය ගැටළුවලට විසඳුම් ලබා දීම වර්ෂයකට වැඩි කාලයක සිට ප්‍රමාද වී තිබුණි.

**(ආ) සයිමන් කඩේ සිට මී ඔය අමුණ දක්වා පාර කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය**

---

ප්‍රාදේශීය සභාව ඉහත මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා 2012 ජුනි 20 දින කොන්ත්‍රාත් සමාගම සමග රු. 9,195,359 ක කොන්ත්‍රාත් වටිනාකමකට (වැට් රහිත) ගිවිසුම් අත්සන් කර තිබුණ ද දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2012 දෙසැම්බර් 20 දින කොන්ත්‍රාත්තුව අවසන් කර 2014 අප්‍රේල් 29 දින රු. 9, 754,042 ක කොන්ත්‍රාත් වටිනාකමට නව කොන්ත්‍රාත්කරුවකු සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරණු ලැබේ.

i. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2014 අගෝස්තු 28 දින වන විට ඉදිකිරීම් අවසන් කල යුතු වුවද , කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍ර අනුව මෙම පාරේ දෙපැත්තෙහි මාර්ග උරහිස් සකස් කිරීම, බෝක්කු වැඩ නිම කිරීම කොන්ක්‍රීට් කුට්ටි වෙන්කර ඇති රෙජ්ෆෝම් ඉවත් කර තාර දැමීමේ වැඩ විගණිත දිනය වූ 2014 නොවැම්බර් 12 දින වන විට ද සම්පූර්ණ කර නොතිබුණි.

ii. නව කොන්ත්‍රාත්කරු සමග ඇති කර ගත් ගිවිසුමට අනුකූලව ඉදිකිරීම් කාලය 2014 ජුලි මස 01 දින අවසන් වූ නමුත් එම දිනයට පසුව ගෙවන ලද මුදලින් අයකර ගත යුතු ප්‍රමාද ගාස්තු රු. 658,398 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 36,068,873 කින් අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ධ (CIGFL) වන රු. 90,172 ක් රඳවාගෙන දේශීය ආදායම් කොමසාරිස්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම සහ අයවැය ප්‍රතිපාදන සියයට 15 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

3.5 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | - | 01 |
| ද්විතික මට්ටම | 10 | 06 | 04 |
| තෘතීය මට්ටම | 26 | 12 | 14 |
| **එකතුව** | 37 | 18 | 19 |

ආයුර්වේද වෛද්‍ය නිලධාරි , කළමනාකරණ සහකාර , තාක්ෂණික නිලධාරි පුස්තකාලයාධිපති සහ විදුලි කාර්මික තනතුරුවල පුරප්පාඩු සම්පර්ණ කිරීමට විගණිත දිනය වන විටද කටයුතු කර නොතිබුණි.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) කොන්තාත් පරිපාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය